**<u>සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරි / කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය</u>**

## 01. හැඳින්වීම

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පල කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 251 රීතියේ විධිවිධාන අනුව සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරි / කළමනාකරණ සහකාර නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු පරිපාටිය.

## 02. වාර්ෂික ස්ථාන මාරු සඳහා යටත්වන නිලධාරීන් පිළිබඳ විස්තර

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි,

I. ප්‍රධාන කාර්යාලය / මහා සංගමය
II. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ කාර්යාල
III. ප්‍රාදේශීය ලේකම් කාර්යාල

### 2.1 ප්‍රියමනාප හා ප්‍රියමනාප නොවන සේවා ස්ථාන:

(අ) කොළඹ ප්‍රධාන කාර්යාලයට පරිභාහිරව ඇති දිස්ත්‍රික් කාර්යාල / ශාඛා කාර්යාල "ප්‍රියමනාප" සහ "ප්‍රියමනාප නොවන" ස්ථාන වශයෙන් වර්ග කෙරේ.

(ආ) වාර්ෂික ස්ථාන මාරු කටයුතු සඳහා පහත දැක්වෙන ප්‍රා.ලේ.කොට්ඨාස ප්‍රියමනාප නොවන ස්ථාන වශයෙන් සලකනු ලැබේ. ප්‍රියමනාප නොවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසක / සේවා ස්ථානයක පිහිටි දිස්ත්‍රික් කාර්යාලයක් / ශාඛා කාර්යාලයක් ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක් වශයෙන් සැලකිය යුතුය. එසේ වුවත්, කිසියම් නිලධාරියෙකු පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හා එයට මායිම්ව පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස / සේවා ස්ථාන ඔහුට / ඇයට "ප්‍රියමනාප සේවා ස්ථාන" වශයෙන් සලකනු ලැබේ.

I. මොණරාගල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
II. නුවරඑළිය දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
III. වවුනියාව දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
IV. කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
V. මුලතිව් දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
VI. මන්නාරම දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
VII. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පළාත, නාච්චාදූව, තඹුත්තේගම සහ මිහින්තලය හැර අනෙකුත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
VIII. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ තමන්කඩුව සහ හිඟුරක්ගොඩ හැර අනෙකුත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
IX. බදුල්ල දිස්ත්‍රික්කයේ බදුල්ල සහ බණ්ඩාරවෙල, හැර අනෙකුත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
X. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ත්‍රිකුණාමලය හැර අනෙකුත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
XI. යාපනය දිස්ත්‍රික්කයේ යාපනය සහ නල්ලූර් හැර අනෙකුත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
XII. මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනෙයි (උතුර) සහ කාත්තන්කුඩි හැර අනෙකුත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස

XIII. පුත්තලම දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) මහකුඹුක්කඩවල
   b) කල්පිටිය
   c) කරුවලගස්වැව
   d) නවගත්තේගම
   e) වනාතවිල්ලුව

XIV. රත්නපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) කොළොන්න
   b) කලවාන
   c) අයගම

XV. හම්බන්තොට දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) ලුණුගම්වෙහෙර
   b) තිස්සමහාරාමය
   c) සූරියවැව

XVI. මාතලේ දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) ලග්ගල පල්ලේගම
   b) විල්ගමුව

XVII. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) ගිරිබාව
   b) පොල්පිතිගම
   c) ඇහැටුවැව

XVIII. අම්පාර දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) දෙහිඅත්ත කණ්ඩිය
   b) උහන

XIX. ගාල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) නෙළුව
   b) තවලම
   c) යක්කලමුල්ල

XX. මාතර දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) කොටපොල
   b) පස්ගොඩ

XXI. මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) උඩුදුම්බර
   b) දෙල්තොට
   c) මිණිපේ

XXII. කෑගල්ල දිස්ත්‍රික්කයේ පහත සඳහන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස
   a) දැරණියගල
   b) යටියන්තොට
   c) බුලත්කොහුපිටිය

(ඇ) ඉහත දක්වා ඇති ප්‍රියමනාප නොවන සේවා ස්ථාන හැර අනෙකුත් සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ප්‍රියමනාප සේවා ස්ථාන ලෙස සලකනු ලැබේ.

(ඈ) එසේම ස්ථාන මාරු ලබාදීමේදී නව සේවා, මුල් සේවා, සේවක අර්ථසාධක අරමුදලේ ආදී වශයෙන් නිලධාරින් වර්ග නොකර සේවා කාලය ගණනය කළ යුතුය.

**2.2 සම්පූර්ණ කළයුතු සේවා කාලය හා කොන්දේසි :**

(i) එකම සේවා ස්ථානයක හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක වසර 05කට වැඩි කාලයක් සේවය කර ඇති කළමනාකරණ සේවා නිලධාරි / කලමනාකරණ සහකාර නිලධාරින් 2026 වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළ යුතුය.

(ii) සාමාන්‍යයෙන් ප්‍රියමනාප සේවා ස්ථානයක උපරිම සේවා කාලය වසර 05 ක් වන අතර, ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක එම කාලය වසර 03කි. ප්‍රියමනාප සේවා ස්ථානයක් සඳහා අදාළ වර්ෂයේ වෙනත් ඉල්ලුම්කරුවන් නොමැතිවීම නිසා හැරෙන්නට සේවා කාලය වසර 05 කට වැඩියෙන් දීර්ඝ නොකළ යුතුය.

(iii) එකම දිස්ත්‍රික්කය තුළ කිසියම් නිලධාරියෙකුට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක හෝ කොට්ඨාස කිහිපයක අඛණ්ඩ සේවා කාලය උපරිම වසර හයකට වඩා වැඩියෙන් ලබාදෙනු නොලැබේ. ඉල්ලුම්කරුවන් නොමැති නම් එම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ හෝ දිස්ත්‍රික්කය තුළ හෝ යාබද දිස්ත්‍රික්කයක හෝ ප්‍රධාන කාර්යාලයෙහි මාරු කිරීමකට යටත්වන නිලධාරින්ගෙන්, මෙතෙක් වැඩිම සේවා කාලයක් සහිත අවම ස්ථාන මාරු කිරීම් වලට භාජනය වී ඇති නිලධාරින්ට ප්‍රමුඛතාවය ලැබෙන පරිදි සකස් කරගත් ලැයිස්තුවකට අනුව, එම දිස්ත්‍රික්කවල කොට්ඨාස වලට ස්ථාන මාරු කළ යුතුය.

(iv) නිලධාරියා සිය කැමැත්තෙන් තවදුරටත් එම ස්ථානයේ සේවයට කැමැත්තක් දක්වන අවස්ථාවන්හිදී හැර ප්‍රියමනාප නොවන සේවා ස්ථානයන්හි වසර තුනකට වැඩියෙන් සේවය කරන ලද නිලධාරින්ට ප්‍රමුඛතා පදනමක් යටතේ ස්ථාන මාරු ලබාදිය යුතුය.

(v) නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති, එහෙත් වාර්ෂික ස්ථාන මාරු සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කර නොමැති අවස්ථාවකදී සහ ස්ථාන මාරු ඉල්ලුම් පත්‍රයෙහි මනාප තුනම සඳහන් කර නොමැති අවස්ථාවකදී එම නිලධාරින්ට වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ අභිමතය පරිදි පුරප්පාඩු වන වෙනත් සේවා ස්ථාන සඳහා මාරුවීම් ලබාදෙනු ලැබේ.

**2.3 ප්‍රධාන කාර්යාලයෙන් බැහැර දිස්ත්‍රික් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා ස්ථාන මාරු කිරීම.**

i ස්ථාන මාරු කිරීමේදී එක් සේවා ස්ථානයක වසර 05ක් (ප්‍රධාන කාර්යාලය තුළ වසර 05 ගණනය කිරීමේදි ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ සියලුම අංශවල අඛණ්ඩ සේවා කාලය මත පදනම්ව ගණනය කිරීම් කළ යුතුය.) හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ට ස්ථාන මාරු වීම් සඳහා ඉල්ලුම් කළ යුතුය. සේවා අවශ්‍යතාවය මත ස්ථාන මාරු කර ඇති විට නිලධාරින්ගේ කැමැත්ත පරිදි තමා සේවයට වාර්තා කළ දින සිට නියමිත සේවා කාලය සම්පූර්ණ වන දිනය ඊට පෙර සේවය කළ නිලධාරියාගේ නියමිත සේවා කාලය සම්පූර්ණ වන දිනය අදාළ සේවා ස්ථානය පුරප්පාඩු වන දිනය ලෙස සැලකිය හැකිය.

ii ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන කාර්යාලයෙන් බැහැරව පිහිටි අනෙකුත් සියලුම කාර්යාල සඳහා ඉල්ලුම්පත් කැඳවීමේදී තමන් කැමති සේවා ස්ථාන, සඳහන් කිරීම සහ ඊට හේතු දැක්වීම තුළින් වුවද ස්ථාන මාරු ලබාදිය හැකි නමුත්, ඉල්ලුම්කර නොමැති සේවා ස්ථාන වෙත සේවා අවශ්‍යතාවය මත කළමනාකරණ සේවා නිලධාරි / කළමනාකරණ සහකාර නිලධාරින් අනුයුක්ත කරන්නේද යන්න ස්ථාන මාරු කමිටුව මඟින් තීරණය කරනු ඇත.

iii මෙම දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වෙනුවෙන් තම ඉල්ලීම අනුව ස්ථාන මාරු ලබා පැමිණ සිටින ඒකාබද්ධ සේවයේ කළමනාකරණ සේවා නිලධාරීන් උපරිම වසර 05ක සේවා කාලය සම්පූර්ණ කරන නිලධාරීන් සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව මෙම දෙපාර්තමේන්තුවෙන් පිටත ස්ථාන මාරු ඉල්ලුම් කළ යුතුය.

iv දෙපාර්තමේන්තුගත කළමනාකරණ සහකාර නිලධාරීන්ද උපරිම වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර හෝ දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල අතර ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළ යුතුය. එහෙත් ප්‍රධාන කාර්යාලය පිහිටි බත්තරමුල්ල ප්‍රදේශය බස්නාහිර පළාතට අයත් වන බැවින් එම පළාතේ පරිපාලන දිස්ත්‍රික්ක වන කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක වෙත ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළ යුතුය. එම දිස්ත්‍රික්ක වල වසර 05කට වැඩි කාලයක් සේවය කර ඇති නිලධාරීන්ට ද ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරු ඉල්ලුම් කළ හැකිය. එමෙන්ම අනෙකුත් දිස්ත්‍රික්කවල සේවය කරන කළමනාකරණ සහකාර නිලධාරීන්ට ද කැමැත්ත අනුව ප්‍රධාන කාර්යාලයට ස්ථාන මාරුවීම් ඉල්ලුම් කළ හැකිය.

**03 වාර්ෂික ස්ථාන මාරු කමිටුවල සංයුතිය පිළිබඳ විස්තර**

ස්ථාන මාරු මණ්ඩල පහත දැක්වෙන පරිදි මණ්ඩල තුනකින් සමන්විත වේ.

1. අන්තර් දිස්ත්‍රික් මාරු මණ්ඩලය
2. දිස්ත්‍රික්කය තුළ මාරුවීම් සඳහා දිස්ත්‍රික් මාරු මණ්ඩලය
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ මාරුවීම් සඳහා ප්‍රාදේශීය මාරු මණ්ඩල

**04. අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු මණ්ඩල සංයුතිය**

1. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) - (සභාපති)
2. අධ්‍යක්ෂ (පාලන) - (සාමාජික)
3. පරිපාලන නිලධාරී (පාලන) - (ලේකම්)
4. වෘත්තීය සමිති නියෝජනය - (නියෝජිතයින්)

**05. දිස්ත්‍රික් ස්ථාන මාරු මණ්ඩල සංයුතිය**

1. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ - (සභාපති)
2. නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ - (සාමාජික)
3. ආයතන කළමනාකරු - (ලේකම්)
4. වෘත්තීය සමිති නියෝජනය - (නියෝජිතයින්)

**06. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ස්ථාන මාරු මණ්ඩල සංයුතිය**

1. ප්‍රාදේශීය ලේකම් - (සභාපති)
2. ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන සුදුසු නිලධාරියෙකු - (ලේකම්)
3. මූලස්ථාන සමෘද්ධි කළමනාකරු / මහා සංගම් සමෘද්ධි කළමනාකරු දෙදෙනාගෙන් එක් අයෙක් - (සාමාජික)
4. වෘත්තීය සමිති නියෝජිතයින් - (සාමාජික)

**07. ස්ථාන මාරු මණ්ඩල පත් කිරීමේ බලය**

අන්තර් දිස්ත්‍රික් මාරු මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන අතර දිස්ත්‍රික් මාරු මණ්ඩලය දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විසින් පත්කළ යුතුය.

**08. ස්ථාන මාරු මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ලේඛන**

I. ස්ථාන මාරු අයදුම්පත
II. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත් ලේඛනය (වා.ස්.මා. 01)
III. එකම සේවා ස්ථානයක අවුරුදු 05ට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින්ගේ ලේඛනය. (වා.ස්.මා. 01)

**09. අභියාචනා මණ්ඩල**

ඉහත එක් එක් මාරු මණ්ඩල සඳහා අභියාචනා මණ්ඩලයක් ද පත්කළ යුතුය. නිලධාරින්ගේ ඉල්ලීම මත මාරුවීම් හෝ සේවා අවශ්‍යතාවය මත වන මාරුවීම් හේතුවෙන් අතෘප්තියට පත්වන නිලධාරින්ට මෙම අභියාචනා මණ්ඩල වලට මෙහි නිශ්චිතව සඳහන් කර ඇති කාල වකවානු නොඉක්මවා අභියාචනා කිරීමට අවස්ථාව ලබාදිය යුතුය.

දිස්ත්‍රික් අභියාචනා මණ්ඩලයේ සභාපති අනිවාර්යෙන්ම දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල් විය යුතු අතර, ඉතිරි නියෝජිතයින් දිස්ත්‍රික් මාරු මණ්ඩලයේ / ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ස්ථාන මාරු මණ්ඩල නිලධාරින්ම පත්කර ගැනීමට දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්ට බලය පවරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සම්බන්ධයෙන් අවසන් තිරණය දිස්ත්‍රික් අභියාචනා මණ්ඩලය සතු වේ.

අන්තර් දිස්ත්‍රික් හා ප්‍රධාන කාර්යාලය වෙත ස්ථාන මාරු සම්බන්ධයෙන් අවසන් තීරණය අධ්‍යක්ෂ ජනරාල් විසින් පත් කරනු ලබන අභියාචනා මණ්ඩලය සතු වේ.

**10. වාර්ෂික ස්ථාන මාරු ලබාදීමේදී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු**

**10.1 සුහද ස්ථාන මාරු කිරීම:**

I. නිලධාරියෙකු සුහද ස්ථාන මාරු කිරීම් වලදි නව සේවා ස්ථානයකට අනුයුක්ත කර වසරක් ගතවන තුරු සුහද ස්ථාන මාරු කිරීම් සිදු කරනු නොලැබේ.

II. සෑම වර්ෂයකම ජුනි 30 වන දිනෙන් පසුව, නව ස්ථාන මාරු ක්‍රියාත්මක වන දිනය වනතුරු සුහද ස්ථාන මාරු කිරිම් සිදු කරනු නොලැබේ.

III. සුහද ස්ථාන මාරු වීම් ලැබූ නිලධාරියෙකු නව සේවා ස්ථානයකට ගියවිට එම ස්ථානයේ කලින් සිටි නිලධාරියාගේ උපරිම සේවා කාලය සම්පූර්ණ වන දිනය එම සේවා ස්ථානය පුරප්පාඩු වන දිනය ලෙස සැලකිය යුතුය.

**10.2 තම සේවා ස්ථානයේ අවුරුදු 2ක සේවයෙන් පසු සේවා ස්ථානයකට ඉල්ලුම් කිරීමේ හැකියාව සියලුම නිලධාරින්ට ඇත.**

**10.3 ස්ථාන මාරු සිදු කිරීමේදී විශේෂ අවස්ථාවන් ලෙස පහත සඳහන් කරුණු සලකා බැලිය හැක. (මේ සම්බන්ධ පිළිගත හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ.)**

I. බරපතල සෞඛ්‍ය හේතු (නිලධාරියා/කාලත්‍රයා/දරුවන්) ස්ථාන මාරුවීම් ලබා දීමේදී සලකා බැලිය යුතුය.

II. දෙමව්පියන් යැපෙන්නන් වීම සහ ඔවුන්ගේ බරපතල සෞඛ්‍ය හේතු ස්ථාන මාරු වීම් ලබාදීමේදී සලකා බැලිය යුතුය. (දෙමාපියන් යැපෙන්නන් බව සනාථ කර ගැනීම සඳහා ග්‍රාම සේවා නිලධාරි සහතික කළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ලිපියක් සහ වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ යුතුය)

III. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයන්හි දිර්ඝ කාලයක් සේවය කොට තිබීම.

IV. සමාන සුදුසුකම් සපුරා ඇති විටෙක අනුරූප තනතුරෙහි ජ්‍යෙෂ්ඨතාවය.

**10.4 I. මාතෘ නිවාඩු ලබා සිට නිවාඩු අවසන් වී සේවයට පැමිණෙන නිලධාරිනියන්ගේ සේවා ස්ථානය පුරප්පාඩු වි ඇති විටෙක දී, නිලධාරිනියගේ කැමැත්ත පරිදි තවත් වසරකින් සේවා ස්ථානයේම සේවය දීර්ඝ කර ගත හැක.**

**II. තමා හා තමාගේ බිරිඳ / සැමියා යන දෙදෙනාම රජයේ නිලධාරින් වන අවස්ථාවන් වලදී කාලත්‍රයා වෙනත් දිස්ත්‍රික්කයකට ස්ථාන මාරු විමක් ලබා තිබේනම්, නිලධාරියා අයදුම් කරන ස්ථානය හෝ දිස්ත්‍රික්කය තුළ සේවා ස්ථානයක පුරප්පාඩුවක් පවතින අවස්ථාවක ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කළ හැක.( සැ.යු. පිළිගත හැකි ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය)**

**10.5** අවුරුදු 58 ක් ඉක්මවූ නිලධරයන් ඔවුන්ගේ ඉල්ලිමක් නොවන කල්හි දිස්ත්‍රික්කය තුළ වුවද මාරු නොකළ යුතුය. ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවය කරන වයස අවුරුදු 59ක් ඉක්මවූ නිලධාරින් ඔවුන්ගේ ඉල්ලිමක් නොමැති කල්හි ස්ථාන මාරු නොකළ යුතුය.

**11. වාර්ෂික ස්ථාන මාරු කාල සටහන**

I. වාර්ෂික ස්ථාන මාරු කමිටු පත් කිරීම - අගෝස්තු මස 01 දිනට පෙර.
II. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීමේ නිවේදනය නිකුත් කිරීම - අගෝස්තු මස 15 දිනට පෙර.
III. වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අංශ ප්‍රධානින් මඟින් ස්ථාන මාරු කමිටුව වෙත ඉදිරිපත් කිරීම සැප්තැම්බර් මස 15 දිනට පෙර.
IV. වාර්ෂික ස්ථාන මාරු කමිටුව විසින් ස්ථාන මාරු සම්බන්ධයෙන් තීරණ ලබාදීම - ඔක්තෝබර් මස 15 වන දිනට පෙර.
V. යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරිම - නොවැම්බර් මස 01 වන දිනට පෙර.
VI. වාර්ෂික ස්ථාන මාරු යෝජනා සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩල පත් කිරීම - නොවැම්බර් මස 15 වන දිනට පෙර.
VII. ස්ථාන මාරුවීම් පිළිබඳ අභියාචනා භාර ගැනීමේ අවසන් දිනය දෙසැම්බර් මස 01වන දිනට පෙර.
VIII. වාර්ෂික ස්ථාන මාරු අභියාචනා මණ්ඩලයේ අභියාචනා තීරණය ලබාදිය යුතු අවසාන දිනය - දෙසැම්බර් මස 31 දිනට.
IX. වාර්ෂික ස්ථාන මාරුවීම් නියෝග බලාත්මක කිරීම - පෙබරවාරි මස 01 වන දින සිට.